(හයවැනි පාර්ලිමේන්තුව — තෙවැනි සභාවාරය)

**අංක. 48]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2008 නොවැම්බර් මස 24 වැනි සඳුදා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0024/’08

1.

ගරු රවි කරුණානායක මහතා,— විදුලිබල සහ බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2007 ජනවාරි මස 12 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව එතුමා කියවා තිබේද;

(ii) එය කියවා තිබේනම්, එහි ලංකා විදුලිබල මණ්ඩලය සම්බන්ධයෙන් සඳහන්ව තිබූ කාරණය සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලංකා විදුලිබල මණ්ඩලයේ සමස්ත ණය ප්‍රමාණය කොපමණද: සහ

(ii) ලංකා විදුලිබල මණ්ඩලයේ සේවක සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0059/’08

2.

ගරු රවි කරුණානායක මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය වර්ෂ තුන තුළ සංචාරක අමාත්‍යතුමා විසින් කරන ලද විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) සංචාරය කරන ලද රටවල් කවරේද; සහ

(iii) ප්‍රවේශ පත්‍ර සඳහා වියදම් සහ හෝටල් ගාස්තු වෙන් වෙන් වශයෙන් සඳහන් කරමින් ඉහත සඳහන් එක් එක් සංචාරයේ වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සංචාරවලදී කැටුව යන ලද පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ ඔවුන් සඳහා දැරීමට සිදු වූ වියදම් වෙන් වෙන් වශයෙන් කොපමණද; සහ

(iii) ඉහත සඳහන් එක් එක් විදේශ සංචාරය සඳහා හේතුව කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මේ සඳහා අයවැයෙන් වෙන් කරන ලද දීමනාව කොපමණද; සහ

(ii) එවැනි සංචාර සඳහා සපයනු ලැබූ පරිපූරක වැය ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0067/'08

3.

ගරු රවි කරුණානායක මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රජයට අයත් ශ්‍රී ලංකාවේ සියලු වරායවල 1994 අප්‍රේල් මස 25 වැනි දිනට ලාභදායිත්වය සහ අද වන විට එහි ලාභදායිත්වය කොපමණද;

(ii) ඉහත (i) ට අනුව 1994 අප්‍රේල් මස 25 වැනි දින වන විට ඩොලරයේ වටිනාකම හා අද වන විට ඩොලරයේ වටිනාකම කොපමණද; සහ

(iii) ඉහත සඳහන් කරන ලද ලාභයේ ඩොලර් වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 1994 අප්‍රේල් මස 25 වැනි දින වන විට හා අද වන විට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සම්පූර්ණ බැරකම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0240/'08

4.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කම්කරු සබඳතා හා මිනිස්බල (කැබිනට්) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0259/'08

5.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂිකර්ම (කැබිනට් නොවන) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0282/'08

6.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0371/'08

7.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) අම්බලන්තොට පහළ බැරගම නින්දගම් ප්‍රදේශවල ඉඩම් අහිමිවූවන්ගේ සමිතිය මගින් වලව වම් ඉවුර සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ ඉඩම් ලබාදෙන ලෙසට ඉල්ලීමක් කර තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම අයට ඉඩම් ලබාදීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද;

(ii) එසේ නම්, ඒ කවදාද;

(iii) ඉඩම් ලබා නොදෙන්නේ නම්, ඒ කවර හේතුවක් නිසාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0402/'08

8.

ගරු අචල ජාගොඩගේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2007 වර්ෂය තුළ මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයට හෝ අමාත්‍යාංශය සතු දෙපාර්තමේන්තු හා සංස්ථා හෝ වෙනත් ආයතන සඳහා අලුතින් පිරිසක් රැකියා සඳහා බඳවාගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම එක් එක් ආයතනය සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ ඒ තනතුර සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ අතුරින් සේවයේ ස්ථිර කර ඇති සංඛ්‍යාව සහ උපාධිධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0469/'08

9.

ගරු විජිත රණවීර මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2007.12.31 වැනි දිනට හම්බන්තොට දිස්ත්‍රික්කයේ මෝදරවාන ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශය තුළ තිබෙන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මහ වාරි, සුළු වාරි සහ වර්ෂා පෝෂිත වශයෙන් ගැනෙන බිම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2007.12.31 වැනි දිනට අදාළ බල ප්‍රදේශය තුළ සිටින කුඹුරු ගොවිතැන් කරන අඳ ගොවි සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඉඩම් හිමි ගොවි සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(iii) ඒ හැර වෙනත් ගොවීන් සිටිනම් එම ගොවීන් සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2000 වර්ෂයේ ගොවිජන සංවර්ධන පනත ක්‍රියාත්මක වීමෙන් පසු 2007.12.31 දක්වා කාලය තුළ අඳ ගොවියා මියයාම හේතුවෙන් ඉඩම් හිමියා සහ අනුප්‍රාප්තිකයා අතර පැන නැඟී ඇති ගැටළු සංඛ්‍යාව කොපමණද;

(ii) ගොවිජන සේවා සහකාර කොමසාරිස් වෙත අදාළ බල ප්‍රදේශය තුළින් වාර්තා වී ඇති අඳ ගොවි ගැටළු සංඛ්‍යාව කොපමණද;

(iii) අඳ ගොවි අයිතිවාසිකම් ලැබූ අනුප්‍රාප්තිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0502/'08

10.

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2004 වර්ෂයේ පුහුණුව ලබා කම්කරු අමාත්‍යාංශය හා විදේශ රැකියා පුද්ගලික සමාගම මගින් ඉතාලියේ හෙද සහායිකා තනතුර සඳහා පිටත්කර යැවීමට තෝරා ගන්නා ලද ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) තෝරාගත් අයගේ නම, ලිපිනය හා අධ්‍යාපන සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එලෙස තෝරා ගන්නා ලද අය අතුරින් මේ වනවිට උක්ත රැකියාව සඳහා ඉතාලියට පිටත්කර යවා ඇති සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම, ලිපිනය, ගුවන් ගමන් බලපත්‍ර අංකය, විදේශගත වූ දිනය හා වේලාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) තෝරාගත් සුදුසුකම් සහිත පුහුණුව ලද අය වෙනුවට වෙනත් අය මෙලෙස ඉතාලියට පිටත්කර යවා ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) ඉතාලියේ පුද්ගලික සුවසේවා හෙද සහායිකා තනතුර සඳහා තෝරාගත් අයගේ රැකියා තත්ත්වය හා ආදායම් මට්ටම සම්බන්ධයෙන් ඉතාලි රජය විසින් මේ වනවිට විමසා ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0517/'08

11.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් පර්යේෂණාගාර සංඛ්‍යාව හා ඒවා පිහිටා තිබෙන ස්ථාන කවරේද;

(ii) එම පර්යේෂණාගාර මගින් සිදුකරන පර්යේෂණ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ නිෂ්පාදන අංශ පිහිටා තිබෙන ස්ථාන සහ නිෂ්පාදනය කරන බීජ වර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2006/2007 වර්ෂවල ඉහත බීජ නිෂ්පාදන අංශ මගින් ගොවීන්ට නිකුත් කළ බීජ නිෂ්පාදන හා ස්ථාන වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම වර්ෂවල ආනයනික බීජ වර්ග හා ප්‍රමාණයන් කවරේද;

(iii) පුද්ගලික අංශයේ බීජ නිෂ්පාදනය කරන ආයතන හා අදාළ බීජ වර්ග කවරේද;

(iv) එම සමාගම් විසින් 2006/2007 වර්ෂවල දේශීය වෙළඳ පොළට නිකුත් කළ බීජ ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0566/'08

12\.
ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ඛනිජතෙල් හා ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1979 අංක 51 දරන පනත යටතේ වරාය කොමිෂන් සභාව ශ්‍රී ලංකා වරාය අධිකාරියට අන්තර්ග්‍රහණය කර ඇති බවත්;

(ii) පැරණි වරාය කොමිෂන් සභාවේ තෙල් පහසුකම් අංශයේ සේවය කළ බී. ඒ. මුණිදාස මහතා 1977.09.20 වැනි දින සිට ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ සේවයට බඳවා ගෙන ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව වෙත මුදා හරින ලද වරාය කොමිෂන් සභාවේ සේවය කළ සියලුම සේවකයින්ගේ විශ්‍රාම වැටුප් කටයුතු ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙන් ඉටුකළද, බී.ඒ. මුණිදාස මහතාගේ විශ්‍රාම වැටුප් තවමත් ලැබී නැති බව එතුමා දන්නෙහිද?

(ඇ) බී.ඒ. මුණිදාස මහතාට විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු නොකිරීමට හේතු කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0665/'08

13\.
ගරු තිලකරත්න විතානාච්චි මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වටවල වැවිලි සමාගම මගින් පාලනය වන ස්ටොක්ස්ලන්ඩ් කොටසින් අක්කර 2 ක් උඩුගම මහා විද්‍යාලයට වන්දි ගෙවීමේ පදනම මත ලබාදීමට එම වැවිලි සමාගම එකඟ වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ඉඩම නොමිලේ ලබාදෙන ලෙස මවිසින් පාර්ලිමේන්තු උපදේශක කාරක සභා යෝජනා අංක 2517/2612 යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරන ලද බවත්;

(ii) 2008 මාර්තු මස 26 වැනි දින පැවති උපදේශක කාරක සභා රැස්වීමේදී පිළිතුරු ලෙස දන්වා ඇත්තේ වටවල වැවිලි සමාගම එය නොමිලේ ලබාදීමට එකඟ වී නොමැති නිසා වන්දි ගෙවීමේ පදනම මත පමණක් සාකච්ඡා කරන ලෙස බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) 1983 – 1984 දී රජය මගින් රබර් වගාකරන ලද මෙම ඉඩම පවරා ගනු ලබන්නේ රජයේ කටයුත්තකට බැවින් හා එසේ පවරා ගැනීමට හැකි බවට කැබිනට් තීරණයක් දී තිබෙන බැවින් අදාළ පවරා ගැනීම සිදු නොකරන්නේ කවර හේතු නිසාද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) රජයේ සංවර්ධන කටයුත්තකට මෙම ඉඩම පවරා ගැනීමට කටයුතු කිරීමේදී පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ මුදල් පෞද්ගලික සමාගමකට වන්දි ලෙස ලබාදීම වරදක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඉ) අදාළ කැබිනට් තීරණය පරිදි ඉහත ඉඩම නොමිලේ පවරා ගැනීමට එතුමා අවශ්‍ය කටයුතු කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0717/'08

14\.
ගරු දයාසිරි ජයසේකර මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ වටිනා සම්පතක් වන අලි සම්පත මේ වනවිට විශාල ලෙස විනාශ වෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ස්වභාවික නොවන හේතූන් නිසා 1990 වර්ෂයේ සිට මේ දක්වා අලි ඇතුන් 2200ට ආසන්න සංඛ්‍යාවක් මියගොස් තිබීම සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදුකර තිබේද;

(ii) මෙම අලි මරණ වළක්වා ගැනීම සඳහා මේ වනවිට ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් කවරේද;

(iii) අලි - මිනිස් ගැටුම් හේතුවෙන් මේ වනවිට විනාශ වී ඇති මිනිස් ජීවිත සංඛ්‍යාව කොපමණද;

(iv) පුද්ගල සහ දේපල හානි ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0727/'08

15.

ගරු එන්. ඩී. එන්. පී. ජයසිංහ මහතා,— ජාතිය ගොඩනැඟීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය ආරම්භයේ සිට 2007 වසර දක්වා අයවැය මඟින් වෙන්කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එකී මුදලින් අධ්‍යාපන, සෞඛ්‍ය, මාර්ග හා විදුලිය යන අංශ සංවර්ධනය සඳහා යෙදවූ මුදල් ප්‍රමාණය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ආ) වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය ආරම්භයේ සිට එක් එක් විදුලි ව්‍යාපෘතිය සඳහා වෙන්කළ මුදල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2009) - (දහතුන්වැනි වෙන්කළ දිනය) — කාරක සභාව (ප්‍රගතිය නොවැම්බර් 21)

*2.

ප්‍රවාහන අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 306— වැඩසටහන 2,—† 2008 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන එක්දහස් පණහකට (රු. 1,050,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතුය.

උපලේඛනය

| | | | | |
|---|---|---|---|---|
| ශීර්ෂය | 306 | — | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | |
| වැඩ සටහන | 2 | — | සංවර්ධන කටයුතු | |
| | | | පුනරාවර්තන වියදම් | රු. 186,000,000 |
| | | | ප්‍රාග්ධන වියදම් | රු. 864,000,000 |
| | | | එකතුව | රු. 1,050,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2008 නොවැම්බර් මස 08 වැනි දින ඉදිරිපත් කරන ලද 2008 අංක 9 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 8 දක්වා එකතුව රුපියල් 27,039,980,332.

*3.

වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ යෝජනාව,— 1971 අංක 38 දරන මුදල් පනතේ 19 වැනි වගන්තිය යටතේ අමාත්‍යවරයා වෙත පහත දැක්වෙන පරිදි විධාන කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 26 දරන ශ්‍රී ලංකා නැව් ඉඩ පහසුකම් වෙන් කිරීමේ මධ්‍යම කාර්යාංශ පනතේ 2 වැනි වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා නැව් ඉඩ පහසුකම් වෙන්කිරීමේ මධ්‍යම කාර්යාංශය විසුරුවා හැරීම; සහ

(ආ) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 26 දරන ශ්‍රී ලංකා නැව් ඉඩ පහසුකම් වෙන් කිරීමේ මධ්‍යම කාර්යාංශ පනතේ 2 වැනි වගන්තිය යටතේ පිහිටුවන ලද රාජ්‍ය සංස්ථාවක් වන ශ්‍රී ලංකා නැව් ඉඩ පහසුකම් වෙන් කිරීමේ මධ්‍යම කාර්යාංශය 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටස ප්‍රකාරව ගණන් බේරා වසා දැමීමේ කාර්ය සඳහා ඈවරකරුවෙකු හෝ ඈවරකරුවන් ලෙස යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් පත් කිරීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*4.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත යටතේ නියමය— 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනතේ 48 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 ජුනි මස 06 දිනැති අංක 1552/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.11.04 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

*5.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— 2002.01.28 වැනි දින රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දාහත්වැනි සංශෝධනයේ 27(2) වගන්තිය යටතේ 2002.01.29 වැනි දින සිට නැවත එම ධුරයට පත් කරන ලදුව, ඉන් අනතුරුව රාජ්‍ය සේවයේ කරන ලද වැටුප් සංශෝධනවලට අනුව මැතිවරණ කොමසාරිස්වරයාගේ වැටුප් 2006.11.23 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද නමුත් ලේකම්වරුන්ගේ ව්‍යවස්ථාව යටතේ මෙම ධුරයට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් එම අවස්ථාවේ නිශ්චය නොකරන ලද හෙයින් මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා නැවත එම ධුරයට පත් කළ 2002.01.29 වැනි දින සිට ධුරය දරන තාක් කාලයට හිමි වැටුප් වර්ධක අගයන් ද වැටුපට එකතු කොට වැටුප් ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*6.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(1) ව්‍යවස්ථාව අනුව එස්. ස්වර්ණජෝති මහතා 2008.01.04 වැනි දින සිට විගණකාධිපති ධුරයට පත් කරන ලදුව, අනතුරුව විගණකාධිපති තනතුරට හිමි එස්එල්-4 රු. 47,515-12x1,425-64,615 වැටුප් ක්‍රමයේ රු.58,915 වැටුප් පියවරේ පිහිටුවීමට තීරණය කරන ලදී. ස්වර්ණජෝති මහතා ධුරය දරන තාක් කල් වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම අමාත්‍ය මණ්ඩලය විසින් 2008.08.06 වැනි දින තීරණය කරන ලද හෙයින් විගණකාධිපති එස්. ස්වර්ණජෝති මහතාට 2008.01.04 වැනි දින සිට රු. 58,915ක මාසික වැටුපක් ගෙවීමට හා ධුරය දරන තාක් තනතුරට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*7.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවනු ලබන මාසික දීමනාව සිය නිත්‍ය තනතුරේ මාසික වැටුපෙන් 1/3 කට සමාන මාසික දීමනාවක් විය යුතු යැයි ද, එය 2007 ජනවාරි මස 01 වැනි දින සිට ගෙවිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට, මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනාව ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*8.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ පාරිශ්‍රමික හා දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

| | | | | |
|---|---|---|---|---|
| සභාපති (පූර්ණ කාලීන) | | | | |
| පාරිශ්‍රමිකය | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |
| සාමාජිකයින් | | | | |
| පාරිශ්‍රමිකය | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද පාරිශ්‍රමිකයෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද පාරිශ්‍රමික හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*9.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 අ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

| | | | | |
|---|---|---|---|---|
| සභාපති (පූර්ණ කාලීන) | | | | |
| දීමනාව | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |
| සාමාජිකයින් | | | | |
| දීමනාව | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද දීමනාවෙන් (ඉන්ධන දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ දීමනාව 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*10.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ තීරණය,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2(7) ඡේදය අනුව එම කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

| | | | | |
|---|---|---|---|---|
| සභාපති (පූර්ණ කාලීන) | | | | |
| වැටුප | - | රු. | 66,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 80,400.00 | |
| සාමාජිකයින් | | | | |
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනා | - | රු. | 12,000.00 | මාසික |
| | එකතුව | රු. | 77,000.00 | |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*11.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

| | | | | |
|---|---|---|---|---|
| සභාපති (පූර්ණ කාලීන) | | | | |
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |
| සාමාජිකයින් | | | | |
| වැටුප | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගේ නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*12.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 4(8) වගන්තිය අනුව පිහිටුවන ලද ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිගේ හා උප සභාපතිගේ වැටුප් 2006.01.01 වැනි දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

| | | | | |
|---|---|---|---|---|
| සභාපති (පූර්ණ කාලීන) | | | | |
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |
| උප සභාපති | | | | |
| වැටුප | - | රු. | 50,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 12,000.00 | මාසික |
| | එකතුව | රු. | 62,000.00 | |

තවද, වැඩි කරන ලද වැටුප් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, 2006 වර්ෂයේ සිට මේ දක්වා කොමිෂන් සභාවේ උපසභාපති තනතුරේ සේවය කර ඇති මහාචාර්ය ලාල් පෙරේරා මහතාට සහ දැනට එම තනතුර දරන ආචාර්ය ජී.ඩී. ගුණවර්ධන මහතාට ද මෙම වැටුප් වැඩිවීම අදාළ විය යුතු යැයිද, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිට හා උප සභාපතිට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*13.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 37 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 37 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 30602 "ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ගබඩා අත්තිකාරම් ගිණුම" දුම්රිය දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | | |
|---|---|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | | |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 1,000,000,000<br>රු. 680,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 3,800,000,000<br>රු. 3,900,000,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 400,000,000<br>රු. 550,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය,

2008.08.28 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*14.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වැනි වගන්තියේ (උ) ඡේදය යටතේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලදුව වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් අනුමත කරන ලද, 2008 ජනවාරි මස 10 දිනැති අංක 1531/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.04.09 වැනි දින ඉදිරිපත් කරන ලද "2008 අංක 1 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ (තේ කර්මාන්ත ශාලා ඉදි කිරිම සහ ක්‍රියාත්මක කිරීම) අවම ප්‍රමිති නියෝග" අනුමත කළ යුතුය.

*15.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥා පනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතුය.

*16.

වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ඔක්තෝබර් 03),— "(105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2006 අගෝස්තු මස 17 දිනැති අංක 1458/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2006.09.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*17.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතුය.

*18.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*19.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*20.

ජාතික පේෂකර්ම හා ඇඟලුම් ආයතනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*21.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*22.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජුනි 17) [1]

*23.

ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*24.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*25.

ඉන්දීය සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*26.

අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*27.

ඉඩම් සංවර්ධන ආඥාපනත (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*28.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04). [1]

*29.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18). [1]

*30.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*31.

සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*32.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04.) [1]

33.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

34.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

35.
ශ්‍රී පාද කල්පවෘක්ෂ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

36.
තාලියවක ශ්‍රී ආනන්ද බෝධි සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

37.
එක්සත් ජනඉසුරු පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

38.
පූජ්‍ය මූණමලේ ධම්මරතන ගුණානුස්මරණ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

39.
ලෝක බෞද්ධ මහා සම්මේලනයේ ශ්‍රී ලංකා ප්‍රාදේශීය මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

## දිනට නියමිත කටයුතුවලට අදාළ සංශෝධන පිළිබඳ දැනුම්දීම

අ1.
"විසර්ජන පනත් කෙටුම්පත (2009)" නමැති පනත් කෙටුම්පතට කාරක සභාවේදී ඉදිරිපත් කරන සංශෝධන සඳහා වෙනම නිකුත් කළ "දිනට නියමිත කටයුතුවලට අදාළ අතිරේකය" නමැති පත්‍රිකාව බලන්න.

**[1]**
" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---